## 27

# 'පෙමතො ජායතී සොකො' නාට්‍යයෙහි නිරූපිත ශෝකෝත්පාදක ලක්‍ෂණ

*ගොඩකන්ද ආරච්චි, එරංග කෞශල්‍ය.*[1]

එදිරිවීර සරච්චන්ද්‍රගේ නාට්‍ය නිර්මාණ පිළිබඳ කරුණු අධ්‍යයනය කිරීමේ දී පෙර'පර දෙදිග නාට්‍ය ලක්‍ෂණ දැකිය හැකි ය. ඔහුගේ නාට්‍යයන්හි සුඛාත්මක මෙන් ම ශෝකාත්මක ලක්‍ෂණ ද ප්‍රකට ව පවතී. 1969 දී නිෂ්පාදනය වූ "පෙමතො ජායතී සොකො" නාට්‍යයට සද්ධර්මාලංකාරයෙහි අන්තර්ගත "ස්වර්ණතිලකා වස්තුව" විෂය වී ඇත. ඇරිස්ටෝටල්ගේ කාව්‍යශාස්ත්‍රයේ දක්වා ඇති පරිදි ශෝකෝත්පාදක නාට්‍ය ලක්‍ෂණ "පෙමතො ජායතී සොකො" නාට්‍යයෙහි අන්තර්ගත වී ඇති ආකාරය අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණයි. පෙරදිග නාට්‍ය සම්ප්‍රදායට අනුගත වී නිර්මිත ගීත නාට්‍යයක් වුව ද එහි අපරදිග ශෝකාත්මක ලක්‍ෂණ දක්නට ලැබෙයි. මෙම පර්යේෂණයේ වැදගත්කම වන්නේ " පෙමතො ජායතී සොකො" නාට්‍යයෙහි ශෝකෝත්පාදක ලක්‍ෂණ පිළිබඳ කරුණු අධ්‍යයනය කිරීමට හැකි වීමයි. ඒ. වී. සුරවීර පරිවර්තනය කොට ඇති ඇරිස්ටෝටල් කාව්‍යශාස්ත්‍රයෙහි අඩංගු ශෝකෝත්පාදක ලක්‍ෂණ හා පැරණි ග්‍රීක ශෝකාන්ත නාට්‍යයන්හි දක්නට ලැබෙන ශෝකෝත්පාදක ලක්‍ෂණ "පෙමතො ජායතී සොකො" නාට්‍යයෙහි කෙතෙක් දුරට නිරූපණය වී ඇතිදැයි යන්න මෙම පර්යේෂණයේ ගැටලුවයි. මෙහි පර්යේෂණ ක්‍රමවේදය ලෙස ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය භාවිත කෙරේ. එහි දී ප්‍රාථමික මූලාශ්‍රය ලෙස සරච්චන්ද්‍රගේ "පෙමතො ජායතී සොකො" නාට්‍යයත්, ශෝකාත්මක නාට්‍ය ලක්‍ෂණ සහිත වෙනත් කෘතිත්, ද්විතීයික මූලාශ්‍රය ග්‍රන්ථ ලෙස ඒ පිළිබඳ ලියවුණු විචාර ග්‍රන්ථත් භාවිත කෙරේ. කාව්‍යශාස්ත්‍රයේ දක්වා ඇති ශෝකාත්මක ලක්‍ෂණ 'පෙමතො ජායතී සොකො' නාට්‍යයේ අන්තර්ගත වී ඇති අයුරු දක්නට ලැබුණ ද, සරච්චන්ද්‍ර ශෝකාත්මක න්‍යායට වහල් නොවී තම ස්වාධීනත්වය ආරක්‍ෂා කර ගත් ආකාරය හඳුනා ගැනීමට ලැබීම මෙම පර්යේෂණයේ ප්‍රතිඵල ලෙස දැක්විය හැකි ය. මේ අනුව සරච්චන්ද්‍රගේ "පෙමතො ජායතී සොකො" නාට්‍යය ශෝකාත්මක නාට්‍යයක ලක්ෂණ විද්‍යමාන කරන්නක් ලෙස නිගමනය කළ හැකි ය.

ප්‍රමුඛ පදඃ ශෝකාත්මක, සුඛාත්මක, ග්‍රීක නාට්‍ය, සම්ප්‍රදාය, පෙර'පර දෙදිග

---

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර, සිංහල අධ්‍යයනාංශය,* erangakaushalya92@gmail.com